# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## වර්ෂ අවසාන ඇගයීම - 2004
## ගණිතය

7 ශ්‍රේණිය | කාලය: පැය 02 යි.

නම / විභාග අංකය : ..............................................................................

### I කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
* එක් පිළිතුරක් සඳහා ලකුණු 02 බැගින් හිමි වේ. (20 × 2 = 40)

(01) හිස්තැන් පුරවන්න. (ඉරට්ට සහ ඔත්තේ යන වචන දෙක පමණක් භාවිත කරන්න.)



(i) මෙහි මල් සංඛ්‍යාව .................................................. සංඛ්‍යාවකි.

(ii) මෙහි සිටින සමනලයින් සංඛ්‍යාව .................................................. සංඛ්‍යාවකි.

(02) (i) මෙම පතරොම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න.

..........................................................................

(ii) එම ඝන වස්තුවේ ශීර්ෂ කීයද?

..........................................................................



(03)




ඉහත එළවළු වර්ග තුනම එක ගොඩකට දැමූ විට ගොඩෙහි මුළු බර කොපමණ ද?

..........................................................................

(04) සුළු කරන්න.

25.75 - 3.95 + 0.451 = ..........................................

(05)



(i) රූපයේ අඳුරු කර ඇති කොටස් සියල්ල මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියන්න.

..........................................................................

(ii) $2\frac{1}{3} \times 3$ සුළු කරන්න.

..........................................................................

(06) මෙම රූප සටහනින් නිවසක පැත්තක් දක්වේ. එහි ඇති සෘජු කෝණයක් සහ මහා කෝණයක් නම් කරන්න.




(i) සෘජු කෝණය ..........................................

(ii) මහා කෝණය ..........................................

(07) (i) 3, 0, -1, -3, 1, -2, 2 යන සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට සකස් කර ලියන්න.

..........................................................................

(ii) ඉහත සංඛ්‍යා දී ඇති සංඛ්‍යා රේඛාවේ දක්වන්න.

To download past papers visit www.vajirapani.blogspot.com




(08) 5 × 5 × y × 5 × y දර්ශක ආකාරයට ලියන්න.

..........................................................................

(09)



(i) රූපයෙහි ත්‍රිකෝණ කීයක් දක්වේ ද?

..........................................................................

(ii) මෙම ත්‍රිකෝණ අයත් වන වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.
(i) සුළු කෝණික
(ii) මහා කෝණික
(iii) සෘජු කෝණික

(10) පහත දී ඇති මිනුම් ඒකක කාණ්ඩ 2කට තෝරා x, y වෙන් රූප තුළ වෙන වෙනම දක්වන්න.
(ග්‍රෑම්, කිලෝ ග්‍රෑම්, මිලි මීටර, කිලෝ මීටර, මිලි ග්‍රෑම්, සෙන්ටි මීටර)



(11)



(i) තිත් රටා මගින් නිරූපණය වන සංඛ්‍යාව කුමක් ද?

.............................................................................

(ii) එම සංඛ්‍යාවේ සියලු ම සාධක ලියන්න.

.............................................................................

(12) රසික නිවසින් පිටත් වූ වේලාව A ඔරලෝසුවෙන් ද රසික නැවත නිවසට ලඟා වූ වේලාව B ඔරලෝසුවෙන් ද දක්වේ. රසික නිවසින් පිටත ගත කළ කාලය පැය කීය ද?

A




B




.............................................................................

(13) දී ඇති රූපය සමාන්තරාස්‍රයක් වන පරිදි සම්පූර්ණ කරන්න. සමාන්තරාස්‍රය ABCD ලෙස නම් කරන්න. එහි සමාන්තර රේඛා යුගල ඊ හිස් (→) මගින් පෙන්නුම් කරන්න.




To download past papers visit
www.vajirapani.blogspot.com

(14) **කළු ලෑල්ල**

| **7A** **වෘන්තය** | **පත්‍ර** | | | |
|---|---|---|---|---|
| 0 | 1 | 1 | 2 | 3 |
| 1 | 0 | 3 | 4 | 6 |
| ---- | ---- | ---- | ---- | ---- |




කළු ලෑල්ලේ දක්වෙන වෘන්ත පත්‍ර සටහනෙහි මැකී ගිය අවසන් පේළිය දකුණු පස ඇති සටහන බලා සම්පූර්ණ කරන්න.

(15) 2.625 *l* , 2.632 *ml* , 2 *l* 750 *ml* යන ද්‍රව ප්‍රමාණ අවරෝහණ පිළිවෙළට සකස් කර "<" හෝ ">" සංකේතවලින් අදාළ සංකේතය යොදා දක්වන්න.

.............................................................................

(16) දී ඇති ඛණ්ඩාංක තලයේ A (2, 3) ලක්ෂ්‍යය ලකුණු කර දක්වන්න.




(17) $2x + 3 = 27$ සමීකරණය විසඳන්න.

.......................................................................................

.......................................................................................

.......................................................................................

To download past papers visit
www.vajirapani.blogspot.com

(18)



(i) මෙය කුමන වර්ගයේ ටෙසලාකරණයක් ද?

.......................................................................................

(ii) හේතු දක්වන්න.

.......................................................................................

(19) PQ දර්පණය මගින් පරාවර්තනය වන ප්‍රතිබිම්බය ඇඳ දක්වන්න.




(20) පැයට කිලෝමීටර් 60 ක වේගයෙන් යන වාහනයක් පැය 1 මිනිත්තු 30ක දී යන දුර කොපමණ ද?

.......................................................................................

# 7 ශ්‍රේණිය - ගණිතය
## II කොටස

* පහත දී ඇති ප්‍රශ්න 8 න් 6 කට පමණක් පිළිතුරු සපයන්න.
* ඔබ විසින් සපයා ගත් කඩදාසි පිළිතුරු ලිවීමට භාවිත කරන්න.

(1) (අ) (i) පහත දක්වෙන සංඛ්‍යා සම්මත ආකාරයෙන් ලියන්න.
735611, 2553894, 18780925, 23175

(ii) මිලියන කලාපය අඩංගු සංඛ්‍යා තෝරා ලියන්න.

(ආ) පෘථිවියේ සිට බුධ ග්‍රහයාට සහ සෙනසුරු ග්‍රහයාට ඇති දුර පිළිවෙලින් පහත දක්වේ. එම සංඛ්‍යා කලාප අනුව වගුගත කරන්න.

56 838 793 524

390 852 741 362

(2) කමනීගේ ළමා මේසයේ දිග 56.5 cm වේ. රමනීගේ එවැනි ම මේසයේ දිග 55.5 cm වේ. එම මේස දෙක දිග අතට එකට ලං කර ගෑවී සිටින සේ තැබූ විට

(අ) (i) මේස දෙකේ මුළු දිග කොපමණ ද?

(ii) රමනීගේ මේසයට වඩා කමනීගේ මේසය දිගින් කොපමණ වැඩි ද?

(ආ) කමනීගේ නිවසේ සිට පාසලට ඇති දුර කිලෝමීටර 1 මීටර් 300 වේ. කමනීගේ පියා ඇය පාසලට ඇරලවා නිවසට ගොස් ආපසු රැගෙන යාමට ද පැමිණේ. කමනී නිවසට රැගෙන ගිය පසු පියා ඇය වෙනුවෙන් ඇවිද ඇති මුළු දුර කොපමණ ද?

(ඇ) 37.5 ÷ 15 සුළු කරන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(3) (අ) (i) 42 සහ 63 ප්‍රථමක සංඛ්‍යාවලින් බෙදීමේ ක්‍රමයෙන් සාධක සොයන්න.

(ii) පහත සඳහන් සංඛ්‍යා ඔබේ පිළිතුරු පත්‍රයේ සටහන් කරගෙන හිස් තැන් පුරවන්න.

42 = .............. × .............. × ..............

63 = .............. × .............. × ..............

හිස්තැන් පුරවන ලද වගුව උපකාර කරගෙන 42, 63 යන සංඛ්‍යා දෙකේ,

(ආ) (i) මහා ම පොදු සාධකය සොයන්න.

(ii) කුඩා ම පොදු ගුණාකාරය සොයන්න.

(4) රූපයේ ABCD සමචතුරස්‍රයකි.
එහි පරිමිතිය 56 cm වේ. AB වෘත්තයේ විෂ්කම්භය වේ.

(i) වෘත්තයේ කේන්ද්‍රය නම් කරන්න.

(ii) AB විෂ්කම්භය සෙන්ටිමීටර කීය ද?

(iii) ABCD සමචතුරස්‍රය හැර වෙනත් සමචතුරස්‍රයක් නම් කරන්න. එහි වර්ගඵලය කීය ද?

(iv) සෘජුකෝණාස්‍රයක් නම් කරන්න. එහි වර්ගඵලය සොයන්න.




(5) (අ) සජාතීය පද තුනක් අඩංගු ප්‍රකාශනයක් ලියන්න.

(ආ) (i) 5p + 6 - 2p + 3 සුළු කරන්න.

(ii) ඉහත සුළු කිරීමෙන් ලැබෙන පිළිතුරෙහි p වල සංගුණකය ලියන්න.

(ඇ)

| m | a | b | a+b | ma | mb | ma+mb |
|---|---|---|---|---|---|---|
| 2 | 1 | 3 | 4 | --- | 6 | ---- |

ඉහත හිස් තැනට ලැබිය යුතු සංඛ්‍යා දෙක පමණක් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(6)



(i) ග්‍රෑම් 400 කිරි පිටි පෙට්ටි 6ක් ස්ථාන දෙකක අසුරා තිබුණේ ඉහත පෙනෙන අන්දමට ය. මෙම පිළියෙල කිරීම්වලදී පරිසරයෙන් අයත් කර ගන්නා ඉඩ ප්‍රමාණය වෙනස් වේ ද? සමාන වේ ද? ඔබේ නිගමනයට හේතු දක්වන්න.

(ii)



රාක්කයක මාමයිට් පෙට්ටි අසුරා ඇත්තේ රූපයේ දක්වෙන ආකාරයට ය. මාමයිට් පෙට්ටියක් ඒකකයක් ලෙස සලකමින් පෙට්ටිවල මුළු පරිමාව සොයන්න.

(iii) ඝනකයක් ඒකකයක් ලෙස සලකමින් දිග පැත්තට ඝනක 4 ක් ද පළල පැත්තට ඝනක 3 ක් ද වන සේ තට්ටුවක් පිළියෙල කර අඳින්න.

(iv) එවැනි තට්ටු තුනක පරිමාව ඝනක කීය ද?

To download past papers visit
www.vajirapani.blogspot.com

(7) (උපදෙස් : කවකටුව, සරල දරය සහ පැන්සලය භාවිත කරන්න.)

(i) A නම් ලක්ෂ්‍යයක් ලකුණු කරන්න.

(ii) A කේන්ද්‍රය වන සේ ඕනෑම වෘත්තයක් අඳින්න.

(iii) එම වෘත්තය මත ලක්ෂ්‍යයක් ලකුණු කර එය P ලෙස නම් කරන්න.

(iv) AP යා කර එහි දිග සෙන්ටිමීටර්වලින් ලියා දක්වන්න.

(v) අඳින ලද වෘත්තය සමාන කොටස් 4කට බෙදා 25% අඳුරු කරන්න.

(8)

| සිද්ධිය | සිදුවීමට ඇති ඉඩ ප්‍රස්තාව |
|---|---|
| a | $\frac{1}{2}$ |
| b | $\frac{5}{9}$ |
| c | $\frac{1}{6}$ |
| d | 0 |

පළමුව දක්වා ඇති වගුව ආකාරයේ වගුවක් ඔබේ පිළිතුරු පත්‍රයේ පිළියෙල කර ගන්න. පහත වම් පස තීරුවේ දී ඇති එක් එක් සිද්ධිය සිදුවීමේ ඉඩ ප්‍රස්තාව දකුණු පස තීරයේ ඇති අගයන් හා ගළපා ඔබ පිළියෙල කර ගත් වගුවේ එය ඊ හිසකින් යා කරන්න.

| සිද්ධිය | සිදුවීමට ඇති ඉඩ ප්‍රස්තාව |
|---|---|
| (a) 1- 6 දක්වා සටහන් කරන ලද ඝනකාකාර දාදු කැටයක 2 සටහන් පැත්ත වැටීම.  | $\frac{1}{2}$ |
| (b) රතු පාට පබළු 5ක් පමණක් ඇති මල්ලකින් ගනු ලබන පබළුව නිල් පාට එකක් වීම.  | $\frac{5}{9}$ |
| (c) කාසියක් වරක් උඩ දැමීමේ දී අගය සඳහන් පැත්ත වැටීම.  | $\frac{1}{6}$ |
| (d) 1 - 9 තෙක් ඉලක්කම් ලියන ලද කාඩ්පත් කට්ටලයකින් අහඹු ලෙස ගන්නා කාඩ් පතක ඇති ඉලක්කම ඔත්තේ සංඛ්‍යාවක් වීම. | 0 |